හඳයාගේ "යුද්ධය" සහ "ඉඩ්"

යෞවුන් මඬල

> හඳගම
> වැනි පුද්ගලයන්
> හෙට දිනයේ දී
> සිංහල මිනිසකු
> සිය දියණියන්
> සහ
> වැදූ මවු සමග
> සංසර්ගයේ
> යෙදෙන
> සිද්ධියක්
> අළලා ද
> චිත්‍රපටයක්
> නිර්මාණය කොට
> ජාත්‍යන්තර
> තරගයකට
> ඉදිරිපත් කරනු
> ඇත.
> යුද්ධයට
> සම්බන්ධ
> කිරීමට ඒ
> චරිතය යුද
> සෙබළෙකු
> කිරීමට තරම්
> ඔහු පසුබට
> නොවනු ඇත

අප මවු බිමේ දැනට පවත්නා 'යුදය' පාදක කොට ගෙන අශෝක හඳගම විසින් නිර්මාණය කරන ලද 'මේ මගේ සඳයි' නමැති, පහත් ලිංගික දසුන්වලින් ගහණ චිත්‍රපටය, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර තරගයකට ඉදිරිපත් කරන ලදුව, මා විසින් නරඹන්නට යෙදුණේ ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ය. මා ද ඇතුළු ව එය නැරඹූ සියලුම ශ්‍රී ලාංකික සිංහල, දෙමළ, සොහොයුරු සොහොයුරියන් ගේ දැඩි පිළිකුලට සහ කලකිරීමට පාත්‍ර වූ ඒ චිත්‍රපටය සහ එහි තේමාව පැසසුමට ලක් කරමිනි 'හඳයාගේ හඳ' නමින් පසු ගිය සතියේ 'සිළුමිණ' පුවත්පතේ යෞවුන් මඬල විශේෂාංගයෙහි පළ වූ ලිපිය කියවූ පසු මෙය ලිවීමට අදහස් කළෙමි.

'මේ මගේ සඳයි' චිත්‍රපටය අගයමින් ලියා ඇති ඉහත සඳහන් ලිපිය, එම චිත්‍රපටය නරඹා සිතේ ජනිත වූ පිළිකුලට යම් කිසි දුර්ගන්ධයක් ද මුසු කිරීමට සමත් වී ඇත. එලෙස ම ඒ ලියුම්කරු චිත්‍රපටය සාධාරණීයකරණය කිරීමට ඉදිරිපත් කර ඇති ඔහු ගේ ම 'මනෝ විග්‍රහයෙන්' හඳගම ගේ 'චිත්ත සන්තානයේ' නියම ස්වභාවය ද අපට මනා සේ ප්‍රත්‍යක්ෂ වෙයි.

මනෝ විද්‍යාඥ සිග්මන් ෆ්‍රොයිඩ් ට අනුව මනස කොටස් තුනකට බෙදෙන බව ද, එයින් ප්‍රාථමික කොටස වන 'ඉඩ්' ප්‍රබලව ක්‍රියා කරන්නේ කුඩා දරුවන් තුළ බව ද, ළදරුවන් ට සිය අවශ්‍යතාවන් සන්තර්පණය කර ගැනීමට තැනක් වේලාවක් නොමැති බව ද පවසන ලියුම්කරු, හඳගම පෙන්වන්නේ එසේ චිත්ත සන්තානයේ ඇති වන මෙම ආවේගශීලී 'ඉඩ්' හි ක්‍රියාකාරීත්වයට පමණක් නතු වූ මිනිසුන් ගැන යැයි පෙන්වා දෙයි. තව ද, මෙම චිත්‍රපටය, ප්‍රාථමික අවශ්‍යතාවන් ගෙන් සන්තර්පණය වීමට පුල පුලා බලා සිටින පෘථග්ජන මිනිසකු ගැන පෙන්වන්නක් බැවින් එය මනෝ විද්‍යාත්මක විග්‍රහයක් යැයි පැසසීමට ද ලියුම්කරු පසුබට නොවෙයි.

සිග්මන් ෆ්‍රොයිඩ් දක්වන පරිදි 'ඉඩ්' මනසේ ප්‍රාථමික කොටස යි. එය ප්‍රබල ව ක්‍රියා කරන අවස්ථාවක් වන ළදරුවා කුසගිනි ඇති වූ විට මවු දෙතන ඉල්ලන්නාක් මෙන් තැන නොතැන නො බලා සිය අවශ්‍යතාවන් පරිපූර්ණ කර ගැනීමට ක්‍රියා කරයි. 'ඉඩ්' පාලනය වන්නේ තෘප්තිය සංසිද්ධවීමේ ප්‍රතිපත්තිය මත ය. එය සත්‍යයකි. එසේ ම කුඩා දරුවා ගේ මෙන්ම තිරිසනා ගේ ද මනස වැඩී නැති බැව් අපි දනිමු. සුනඛයන් සහ ගවයන් තැන නොතැන නොබලා සිය අවශ්‍යතාවන් සපුරා ගන්නා අන්දම අපි නිරතුරුව දකිමු. කරුණු එසේ වුව ද, ළදරුවා ක්‍රම ක්‍රමයෙන් වැඩෙන විට ඔහු ට ගෝචර අගෝචර, සත්‍ය අසත්‍ය, හොඳ නරක, ශිෂ්ට අශිෂ්ට යනාදී දෑ පිළිබඳව අවබෝධයක් ඇති වේ. ඔහු මාපිය, ගුරුවර, වැඩිහිටියන් වෙතින් සදාචාරය, සත්‍යත්වය, සාරධර්ම යනාදිය උගනී. එලෙස වැඩුණු දරුවා ඉන් පසු පිපාසය දැනුණු විට දෙතෝදනක් මැද මවු දෙතනේ නො එල්ලෙයි. තැන නොතැන නොබලා මළ මුත්‍ර නො කරයි. තිරිසනුන් මෙන් මහපාර මැද සංසර්ගයේ නො යෙදෙයි. එසේ වන්නේ සමාජ සාරධර්ම කෙරෙන් සහ ශිෂ්ට යැයි සම්මත සම්මුතීන් හි අවබෝධය මගින් 'ඉඩ්' හි ක්‍රියාකාරීත්වය පාලනය කිරීමට තරම් දියුණු වූ මනසක් ඔහු සතු ව ඇති හෙයිනි. ඔහු දැන් තිරිසනා ගෙන් වෙනස් වන්නේ එබැවිනි. එසේ නම් ලියුම්කරු ගේ ම 'මනෝ විග්‍රහයට' අනුව හඳගම පෙන්වන්නේ අතෘප්තිකර ආශාවන් තැන නොතැන නොබලා සන්තර්පණය කිරීමට සැදි පැහැදි සිටින, 'ඉඩ්' හි ක්‍රියාකාරීත්වය පාලනය කර ගැනීමට නොහැකි, තිරිසනුන් වන් මිනිස් සමූහයක් ගැන පමණක් නො වේ ද? එවන් 'තිරිසන් මිනිසා' නියෝජනය කිරීමට හඳගම තිඟීන ලෙස තෝරාගෙන ඇත්තේ, වරෙක දිවි පරදු කොට සටන් වදින 'සිංහල' සෙබළා ය. තවත් වරෙක ආර්ය සංඝරත්නයෙන් පැවත එන, ලෞකික සැප සම්පත් අතහැර දැමූ 'සිංහල' බෞද්ධ භික්ෂුවකි. තවත් වරෙක සැමියා අහිමිවීමෙන් තැවෙන, විවිධ දුෂ්කරතා මැද දිවි ගෙවන 'සිංහල' වැන්දඹු සෙබළ බිරියකි. බෞද්ධ භික්ෂුව ද ඇතුළු ව මුළු මහත් සිංහල ජනතාව ම හැල්ලුවට පත් කරමින්, 'විනය ගරුක සෙබළා ගේ පෞරුෂත්වයට ගරහමින්, රටේ දැවෙන ප්‍රශ්නයක් පාදක කොට ගෙන යැ යි එළි දක්වෙන මෙවන් නිර්මාණ සහ ඒවා සාධාරණීකරණය කිරීමට සැදි පැහැදි සිටින්නන් අපේක්ෂා කරන්නේ කුමක් ද?

හඳගම වැනි පුද්ගලයන් හෙට දිනයේ දී සිංහල මිනිසකු සිය දියණියන් සහ වැදූ මවු සමග සංසර්ගයේ යෙදෙන සිද්ධියක් අළලා ද චිත්‍රපටයක් නිර්මාණය කොට ජාත්‍යන්තර තරගයකට ඉදිරිපත් කරනු ඇත. යුද්ධයට සම්බන්ධ කිරීමට ඒ චරිතය යුද සෙබළෙකු කිරීමට තරම් ඔහු පසුබට නොවනු ඇත. එලෙස ම, ලිංගික ආශාවන් සංතර්පණය කිරීම වූ කලී මිනිසා ගේ මූලික අවශ්‍යතාවක් බව ද, යුදයෙන් හෙම්බත් වූ ආර්ථික පරිහානියට පත් සමාජයක 'ඉඩ්' ක්‍රියාකාරීත්වය ප්‍රබල යැ යි ද පවසමින් ඒ චිත්‍රපටය ශ්‍රේෂ්ඨ මනෝ විද්‍යාත්මක කෘතියක් යැ යි හැඳින්වීමට ද අත්තනායක වැන්නන් උත්සුක වනු ඇත. එවැන්නක් ඉදිරියේ දී සිදුවන තුරු අපි නිහඬව බලා සිටිය යුතු වෙමු ද?

ලිංගික ආශාවන් ගේ සන්තර්පණය, ආහාර, ජලය මෙන් මිනිසා ගේ මූලික අවශ්‍යතාවක් බැව් මනෝ විද්‍යාඥයන් පිළිගන්නා බව පවසන ලියුම්කරු, බුදුන් වහන්සේ පවා දම් දෙසුමට පෙරාතුව කුසගින්නේ සිටින්නන් ගේ කුසගිනි නිවීමට කටයුතු කර ඇති බැව් පෙන්වා එමගින් තම තර්කය තහවුරු කිරීමට උත්සාහ දරයි. බුදුරජාණන් වහන්සේ, කුසගින්නේ බණ ඇසීමට පැමිණි අයෙකුට ආහාර ලබා දී කුසගින්න නිවා ඉන් අනතුරුව බණ දෙසූ බැව් අප අසා ඇති නමුදු, අධික කාමාශාවෙන් මුළාපත් වී, බණ මඩුවේ සිටි කවරෙකුවත්, වෙනත් අයෙකු සමග සංවාසයේ යොදවා, ඔවුන්ගේ කාමය සංසිඳුවීමෙන් පසු, බණ දෙසූ බවක් අප නම් කොතැනක දී වත් අසා නැත. කාමයේ වරදවා හැසිරීමේ ආදීනවත්, ඒ හා සම්බන්ධ ව ගිහි ජීවිතය පිරිහෙන අන්දම ගැනත්, ලෝකය පාලනය කරන 'හිරි ඔතප්' යන සංස්ථා දෙක ගැනත්, සමස්තයක් වශයෙන් සියලු ම දෑ හි 'අනිත්‍ය' ස්වභාවය ගැනත්, ලොව දැනුම්වත් කළ තිලෝගුරු බුදුරජාණන් වහන්සේට, ලිංගික සන්තර්පණය ම මූලික කොට නිපද වූ චිත්‍රපටයක් සාධාරණීකරණය කිරීම සඳහා ඈඳ ගැනීමෙන් ලියුම්කරු ගේ 'මනෝවිද්‍යා ඥානය' සේ ම 'බෞද්ධ ධර්මය' පිළිබඳ ඥානයේ තරම ද අපට පෙන්නුම් කරයි. තර්ක ඥානය කෙබඳු දැ යි මොනවට පසක් වෙයි.

අශෝක හඳගමට, ඔහු ගේ චිත්‍රපටයේ එක් දසුනකින් පෙන්වන පරිදි, ස්වකීය බිරිය ගේ උඩුකය පමණක් නො ව මුළු ශරීරය ම නිරුවත් කොට දක්වමින් හෝ තවත් දසුන්වලින් පෙන්වන පරිදි ගැහැනුන් මිනිසුන් බල්ලන් බළලුන් සේ පඳුරු ගානේ සංසර්ගයේ යෙදෙන අයුරු දක්වමින් හෝ සිය චිත්ත සන්තානයේ 'ඉඩ්' හි ප්‍රකෘති තත්ත්වය ලොවට හඬගා කීමට කිසියම් අයිතියක් තිබිය හැකි ය. එහෙත් අද අපේ මාතෘ භූමිය මුහුණ පා ඇති ජාතික ප්‍රශ්නයක් වන 'වර්තමාන යුදය' ඈඳ ගනිමින්, යුද වදින නිර්භීත සෙබලා, සෙබළ මැණිවරුන් පියවරුන් සහ සෙබළ බිරියන් ගේ ආත්ම ගෞරවය කෙලෙසන අයුරින් හා, එමගින් මවු බිමට නිගා දෙන අයුරින් ඔහුට හෝ වෙනත් කිසිවෙකුට හෝ මොනයම් නිර්මාණයක් කිරීමට නම් කිසිසේත් ම අයිතියක් නැති බැව් සිහිකර දීමට නිසි කාලය දැන් එළඹ ඇතැයි සිතමි.

රුදුරු එල්.ටී.ටී.ඊ.ය අද ජාත්‍යන්තර මට්ටමින් මනා සේ සංවිධානය වී ඇත. ශ්‍රී ලාංකික දෙමළ ජනතාව නිරතුරුව ම සිංහලයන් ගේ තාඩන පීඩනවලට ලක් වන පිරිසක් බවත්, අහිංසක දෙමළ ජනතාව 'කුරිරු අම්බ' සිංහලයන් ගෙන් බේරා ගැනීමට ඊළම හැර වෙනත් විකල්පයක් නොමැති බවත්, පෙන්වන ඔවුහු, ජාත්‍යන්තර ප්‍රජාවට වංචනික ලෙස කරුණු ඉදිරිපත් කරමින් දිගුකාලීන දුෂ්ඨ කර්තව්‍යයක යෙදී සිටිති. එලෙස අනුකම්පාව ලබන බොහෝ රටවල එල්.ටී.ටී.ඊ. සංවිධානය අද තම කාර්යාල පවත්වාගෙන යමින් අරමුදල් එකතු කිරීම, අවි ආයුධ මිල දී ගැනීම, යනාදී ත්‍රස්තවාදී කටයුතුවල නිරත වෙයි. අප රට මුහුණ පා ඇති මෙවන් සැහැසි ජාත්‍යන්තර තත්ත්වයක් යටතේ හඳගම වැන්නන් ලොවට පෙන්වන්නට සැරසෙන්නේ කුමක් ද? සිංහලයා යනු සාරධර්ම නොදන්නා සදාචාරයක් නොමැති අමන ජාතියක් බවත්, සෙබළා යනු නොහික්මුණු, විනයක් නැති ජඩයෙකු බවත්, බෞද්ධ භික්ෂුව ස්ත්‍රී දූෂකයකු බවත්, සෙබළ බිරිය අනාගත ආර්ථික ස්ථාවරයට පමණක් සෙබළා විවාහ වන වෙසගනක් බවත් ඒ මගින් දෙමළ තරුණිය නිරතුරුව ම සිංහලයා සෙබළා ගේ සහ භික්ෂුව ලිංගික සූරාකෑමට ලක්ව අයුරුත් ය. කරුණු එසේ න හඳගම වැන්නන් ලොවට කීම උත්සාහ ගන්නේ කුමක් ද?

'මේ මගේ හඳයි' චිත්‍රපටයෙන් හඳගම පෙන්වා දෙ සිංහල සංස්කෘතිය යථාර්ථය ද? මේ චිත්‍රපටය අගයමින් ලිපි ලියූ ලියුම්කරු පවා චිත්‍රපට එන චරිත සැබෑ ජීවිතයේ කිසි හමු නොවීමට පිළිවන් යැයි ද කියයි. එසේ නම්, අධ්‍යක්ෂවරයා ගේ මනසේ ආරෝපණය වූ එවන් මනඃකල්පිත චරිතවලින් රටක සංස්කෘතියක් විකෘති කොට ලොව ඉදිරියේ පිළිබිඹු කිරීමට තැත් කිරීම මොන තරම් සැහැසි ක්‍රියාවක් ද? චිත්‍රපටය නැරඹීමට එන්නේ අත්තනායකලා වැනි 'ඉඩ්' විශාරදයින් නො ව සාමාන්‍ය ජනතාව ය. මෙය නැරඹූ මගේ ඉන්දීය මිත්‍රයන් හට අපේ සංස්කෘතිය මෙය නො වේ යැ යි පහදා දීමට මට බොහෝ වෑයමක් දරන්නට සිදු විය. මෙය නැරඹූ සෙසු ලොව දහස් ගණන් ජනයා අප රට ගැන, සෙබළා ගැන, සිංහල කුල කාන්තාවන් ගැන කුමන චිත්‍රයක් සිත්හි මවා ගනු ඇත් ද? මගේ දෑසට කඳුළක් නැගෙනුයේ එ බැවිනි.

මීට දශක කීපයකට පෙර තිරගත වූ 'මදර් ඉන්දියා' නමැති හින්දි චිත්‍රපටය මගේ මතකයට නැගේ. සැමියා මළ පසු විවිධ ආර්ථික දුෂ්කරතා මැද, කාමාතුරයන් ගෙන් ද මිදී, පතිවත රකිමින් තම පුතුන් දෙදෙනා පෝෂණය කරන ඒ මව, සමාජය විසින් ම සොරෙකු බවට පත් කරන ලද තම බාල පුතණුවන්, තරුණියක බලහත්කාරයෙන් රැගෙන යාමට තැත් කරද්දී වෙඩි තබා මරාදමන්නී ය. ඇය තම පණ වන් පුතු ඝාතනය කරන්නේ සාරධර්ම සදාචාරය සහ විනය රැකීම උදෙසා ය. ඇය පසු කලෙක 'භාරත මාතාව' නමින් විරුදවලී ලබයි. ඒ සිනමා කෘතියෙන් ඉන්දීය කාන්තාව සහ, සදාචාරය, සාරධර්ම රැක ගැනීමට ඉන්දියානුවන් ගේ තිබෙන කැපවීම ගැන ලොවට දෙන පණිවිඩය කෙතරම් උතුම් ද?

හඳගම ගේ චිත්‍රපටයේ නිරූපණය කරන සෙබලා ගේ මව හැඟීම් විරහිත රූකඩයෙකි. සෙබළ පුතු වෙනුවෙන් ඇ එක් කඳුළු බිඳුවකදු නොහෙළන්නී ය. රට කාබාසිනියා වුවත් ඇයට කම් නැත. මවට කිසිසේත් ම ගරුත්වයක් නොපෙන්වන සෙබල පුතා මව ඉදිරියේ බොහෝ විට නිරුවතින් හැසිරේ. එක් අවස්ථාවක දී සෙබලා ගේ ඒ මහලු මවට, පියා ලිංගික හැඟීම් ඉස්මතු කරවීමට උත්සාහ දරන දසුන් කෙතරම් නින්දිත ද? වර්තමානයේ රටේ පවතින යුද්ධය අළලා යුද්ධයට සෘජුව ම දායක වන සෙබළකු ගේ මව සහ පියා සම්බන්ධ කොට එවන් ජවනිකාවක් ඉදිරිපත් කළ හැක්කේ, තම කාමාශාවන් රිසි සේ සන්තර්පණය කර ගත නො හැකි, ලිංගික අසහනයෙන් පෙළෙන, මානසික රෝගියකුට හැර වෙන කවරෙකුට ද?

මෑතක දී තිරගත වූ 'බෝඩර්' නැමැති හින්දි චිත්‍රපටයෙන් පෙන්වන්නේ සතුරු මාධිමේ ඉන්දීය සෙබළුන් මවුබිම බේරා ගැනීමට නිර්භීතව සටන් කරන සහ රට වෙනුවෙන් දිවි පුදන ආකාරය යි. ඔවුන් ගේ බිරියන් ඔවුන් වෙනුවෙන් කැපවන, කඳුළු සළන සහ ඔවුන්ට දිරි දෙන ආකාරය යි. නරඹන්නන් සිනමාහලෙන් පිට වන්නේ තම මාතෘ භූමිය ගැන, සෙබලා ගැන දැඩි ගෞරවයක්, භක්තියක් සිත්හි දරාගෙන ය. රටක පවතින සංවේදී ජාතික ප්‍රශ්නයක් මුල් කොට ගත් මේ හා සමාන දේශප්‍රේමී හැඟීම් මතුවන ලොව නත් දෙසින් බිහි වූ සිනමා කෘතීන් සිය ගණනක් තිබෙන මුත් ශ්‍රී ලංකාවේ එවන් එක් නිර්මාණයකුදු මෙතෙක් බිහි නොවීම කෙතරම් ඛේදජනක ද? යුදය අළලා නිර්මාණය කරන ලද හඳගම ගේ මේ චිත්‍රපටයේ එන සෙබළ බිරිය ද, සටනේ දී මියගිය තම සැමියා ගේ චිතකයේ ගිනි නිවෙන්නටත් මත්තෙන් වෙනත් මිනිසකු ගේ පහස පතන අයුරු පෙන්වන්නේ ඉතා නින්දිත අයුරිනි. සිංහල කාන්තාවන් සෙබළුන් විවාහ කර ගන්නේ ආර්ථික වාසි සඳහා මිස ප්‍රේමය හෝ රට දැය ගැන හෝ හැඟීමකින් නොවන බැව් පුන පුනා පෙන්වීමට ඔහු ප්‍රබල උත්සාහයක යෙදෙයි. සැමියා මියගිය පසු වෙනත් කෙනෙකු හා විවාහ නොවන්නේ ද වන්දි මුදල් අහිමි වන නිසා වන අතර, ලිංගික ඇසුර සඳහා 'රෑට අපේ දිහා ආවට කමක් නැහැ' යි, පසු පස එන තොසත්ධාලයෙකුට ඇය ආරාධනා කරයි. කලාකරුවකු ලෙස ජීවත් සිටින හඳගම, සිංහල කාන්තාව පිළිබඳ ව, රටට සහ මුළු ලොවට දෙන මේ පණිවුඩය යථාර්ථයක් ද? විවාහ වී සිටින අතරේ පිට මිනිසුන් ගේ පහස පතන ගැහැනුන් නැතැයි කියන්නේ කවුරු ද? එහෙත් තම ස්වාමි පුරුෂයා වෙනුවෙන් බුත් පහා බෝධිපූජා පවත්වමින්, ඔහු ගේ ගෞරවය රකිමින්, දිවි දෙවෙනි කොට පතිවත ආරක්ෂා කරමින්, අනේක විධ ආර්ථික සහ ගෘහස්ථ ගැටලු ඉදිරියේ නොසැලී තම දූ පුතුන් පෝෂණය කරමින්, රණබිමේ ලාට සහනයක් වන පරිදි දිවි ගෙවන දස දහස් ගණන් සෙබළ බිරියන් ගැන මෙම අධ්‍යක්ෂවරුන් දන්නේ ම නැති සේ ය. එවන් උතුම් කාන්තාවන් ඔවුන් ගේ පවුල්වල හෝ සමීප මිතුරන් අතර හෝ නැත්නම් එය පුදුමයට කරුණක් නො වේ. පුදුමය නම් මේ චිත්‍රපටය ලංකාවේ තිරගත වූ පසුත් එහි අන්තර්ගතය පිළිබඳ බරපතළ සංවාදයක් ඇති නො වීම ය.

ලොව යුදය ගැන කැරුණු සිනමා කෘතීන් ගැන අපි කොතෙකුත් අසා නරඹා ඇත්තෙමු. එවන් සාර්ථක නිර්මාණයන් කළ සැම දෙනෙකු ම පාහේ ඒවා බිහි කිරීමට පෙර අදාළ යුදය ගැන ගැඹුරින් හදාරයි. ඒ ඒ ස්ථානවලට ගොස් පෞද්ගලිකව ම අත්දැකීම් ලබයි. එසේ ගොස් සිටිය දී සතුරු ප්‍රහාරවලට අසු වී මිය ගිය කලාකරුවන් ගැන ද අපි අසා ඇත්තෙමු. අප කලාකරුවන් ද යුදය අළලා නිර්මාණ කරන්නේ නම් යුද පිටියට ගොස් එහි අත්දැකීම් ලබා ගත යුතු ය. සෙබළු විඳින අපහසුතා, දුක, මුහුණ පාන රාජකාරි සහ පෞද්ගලික ගැටලු, පිළිබඳ ව හැදෑරිය යුතු ය. හඳගම මහතා ද සතුරු පෙනෙන තෙක් මානයේ ඉදි වූ බංකරයක අපේ සෙබළුන් රාජකාරීත් කරන ආකාරය දත්තේ නම්, වැසි කාලයේ බූට් සපත්තු තුළ වතුර රැඳී තැම්බුණු ඇඟිලි සහිත ව, තිල ඇඳුම් පවා සෝද වේලා ගැනීමට නොහැකි ව, වාහන මඩේ එරීම හේතු කොට ගෙන, නිසි වේලාවට ආහාර පවා ගැනීමට නොහැකි ව සිටිය දීත්, නොපිරිහෙලා සිය රාජකාරීත් කරන අන්දම සියැසින් දුටුවා නම්, උන්මත්තකයකු සේ හැසිරෙන, මානුෂික හැඟීම් විරහිත, ලිංගික හැඟීම් පමණක් උතුරා ගිය මනඃකල්පිත, සෙබළකු ගේ චරිතයක් ඔහු ගේ චිත්‍රපටයට ඇතුළත් නොකරනු ඇත. සටන් බිමේ දී වර්ධනය වන කණ්ඩායම් හැඟීම, සහෝදරත්වය පිළිබඳව අවබෝධ කර ගත්තේ නම් සිය සගයා දැවෙන සෑයෙන් සෙබළා තම සිගරට්ටුව දල්වන දසුනක් ඇතුළත් නොකරනු ඇත. සෙබළා යනු 'ඉඩ්' ක්‍රියාකාරීත්වයට පමණක් නතු වූ මිනිසෙකු නො ව මනස උස් වූ යි අරුත් දෙන මනුස්සයන් කොටසක් බැව් ඔහුට එවිට ප්‍රත්‍යක්ෂ වනු ඇත. එවන් මනුස්සයන් ගේ චිත්ත ධෛර්යය වඩවන, ඔවුන් ගේ බිරියන් ගේ ආත්ම ගරුත්වය රැකදෙන නිර්මාණ ඔහු අතින් එපිට බිහිවනු ඇත. එවන් අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ට හිතැති සැබෑ විචාරකයන් මතු නිර්මාණ සඳහා යුද බිමට පැමිණෙන්නේ නම් ඉතා උණුසුම් අයුරින් ඔවුන් පිළිගැනීමට අප සූදානම් යි.

රියර් අද්මිරාල් සරත් වීරසේකර,
නාවික කඳවුර, කන්කසන්තුරය